**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය - 2019**

**------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකගේ වගකීම

--------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 14,076,266ක් වූ වත්කම් අයිතම 11ක් යටතේ වූ දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත. කෙසේවෙතත්, එම වත්කම් දැනටත් භාවිතා කරනු ලබන අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - 07 ප්‍රකාරව නැවත අගය කර ගිණුම සකස් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොමැත. | දැනටමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම් නැවත ඇගයීමට ලක්කර ගිණුම් පොත්වල අදාළ සංශෝධනයන් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලැබී ඇති වටිනාකම රු. 2,500,000ක් වූ ප්‍රදානයන් ක්‍රමක්ෂය කර නොමැති අතර, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ප්‍රදානයන් ලෙස දක්වා ඇත. | මේ සම්බන්ධයෙන් වන සාක්ෂි සොයාගැනීමටත්, ඒ අනුව ගිණුම් පොත්වල අවශ්‍ය සංශෝධනයන් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් වන සාක්ෂි සොයාගැනීමටත්, ඒ අනුව ගිණුම් පොත්වල අවශ්‍ය සංශෝධනයන් කිරීමටත් අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.6 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

### 1.6.1 ලැබියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවයෙන් ඉවත් කළ, මිය ගිය හා විශ්‍රාම ගිය කාර්ය මණ්ඩල නිලධාරීන් 06 දෙනෙක් වෙනුවෙන් ලබාදී ඇති එකතුව රු. 679,352ක් වූ ණය මුදල් වර්ෂ 07ක කාලයක් තුළ ගිණුම් තුළ පවතින අතර, ඇපකරුවන්ගෙන් හෝ අර්ථසාධක අරමුදලෙන් එම ණය අයකරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොමැත. | ඔවුන්ගේ අර්ථසාධක අරමුදලෙන් එම ණය ශේෂයන් ආවරණය කරගැනීම සඳහා ලිපි යැවීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.7 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති ,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3(I) වගන්තිය සහ 2017 ජුලි 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක. 10/2017 දරන ලිපි | උසස් අධ්‍යාපන ආයතනයේ සෑම නිලධාරියෙක්ම පැමිණීම හා පිටවීම සටහන් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කිරීමකින් තොරව එකතුව රු. 125,374,799ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා ඇත. | එක් එක් දෙපාර්තමේන්තුවට අදාළව පැමිණීමේ ලේඛන පවත්වාගෙන යනු ලබන අතර, පැමිණීම සටහන් කරනු ලබන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පමණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල විභාග අත්පොත සහ XV පරිච්ඡේදයේ 2,4 සහ 5 වගන්තිවලට අදාළ ක්‍රියා පටිපාටි | ආයතනයේ සියලුම දෙපාර්තමේන්තුවල පිළිතුරු පිටපත් පරීක්ෂා කිරීමේදී පිළිතුරු පිටපත්වල ලකුණු ඇතුළත් කර ඇති බව අනාවරණය විය. පළමු හා දෙවන විභාග ඇගයුම්කරුවන් විසින් ලබාදී ඇති ලකුණු සමාන වන අතර, එම ලකුණුවල අපගමනයක් දක්නට නොලැබුණි. එබැවින් ඇගයීම් පද්ධතියේ රහස්‍යභාවයක් දක්නට නොලැබුණි. | ආයතනය විසින් දැනට ක්‍රියාත්මක ඇගයීම් ක්‍රමවේදයන් අනුගමනය කරයි. විභාග ඇගයුම්කරුවන් විසින් ස්වාධීනව ඇගයීම් කටයුතු සිදුකළ යුතු අතර, ඔවුන් අතර රහස්‍යභාවය පවත්වාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. | විශ්වවිද්‍යාල විභාග අත්පොත සහ අදාළ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. පීඊඩී/12 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඇතුළත් නොකරන ලද වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් රේඛීය අමාත්‍යාංශය හා ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක. අයිඒඅයි/2002/02 | රු. 666,355,916ක් වටිනා ස්ථාවර වත්කම්වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සහ සවිස්තරාත්මක වැඩසටහන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2016 අගෝස්තු 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 18/2016 | රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සියලුම නිලධාරීන් විදේශගත වන අවස්ථාවලදී සිය විදේශ නිවාඩු සඳහා ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද, නිලධාරීන් තිදෙනෙකු ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් දිවයිනෙන් පිටත්වීමට පෙර විදේශ නිවාඩු නිර්දේශ කරගනු ලබන අතර, අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කෙරේ. එහෙත් රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන ලිපි ලැබීමේදී ප්‍රමාදයන් සිදුවන අතර එම අනුමැතිය අමාත්‍යාංශය විසින් ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත ඉදිරිපත් නොකොට වෙන්කලාඩි ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,344,485 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,511,914 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,856,399ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හේතු වී ඇත්තේ අධ්‍යයන දිමනා රු. 17,850,798කින් සහ පාරිතෝෂික දීමනා වෙන්කිරීම් රු. 6,444,558කින් ඉහළ යාමයි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ආදායම් හා වියදම් ලෙස පිළිවෙලින් රු. 237,275,000 ක් හා රු. 208,168,823ක් පුනරාවර්තන ප්‍රදානයන් හා පුද්ගලික වැටුප් ලෙස හඳුනාගත් අතර, එය පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 22ක හා සියයට 45ක වැඩිවීමකි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළ ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1.54 සහ 1.43 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම්වල රු. 9,847,141ක් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වර්ෂයට සාපේක්ෂව එය 0.55කින් අඩුවී තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය ආරම්භයේ සිට වර්ෂ 15ක් ගතවී ඇතත්, ස්වයං මූල්‍ය ආදායම් ප්‍රභවයක් වශයෙන් ආයතනය විසින් බාහිර උපාධි හෝ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කර නොතිබුණි. | අපගේ අධ්‍යයන පාඨමාලා ප්‍රායෝගිකත්වයට නැඹුරු වන අතර යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් ශාස්ත්‍ර අයකිරීමේ පාඨමාලා ආරම්භ කර නොමැත. කෙසේවෙතත්, 2019 වර්ෂයේ සිට අමතරව බිතු සිතුවම් පාඨමාලා ආරම්භ කරන ලදී. | බාහිර උපාධි හෝ ඩිපලෝමා පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදානයන් වශයෙන් රු. 15,000,000ක් ලැබී ඇති අතර, ඉන් සියයට 39ක් හෙවත් රු. 5,872,155ක් 2019 වාර්ෂික අයවැය හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් වන පරිදි අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | මෙම අදහස් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | ප්‍රාග්ධන ප්‍රදානයන් නියමිත කාලසීමාව තුළ අපේකෂිත අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේදී හඳුන්වාදුන් ක්‍රියාකාරී සැලැස්ම අනුව, නව උපාධි වැඩසටහන් හතරක් හඳුන්වාදීම හා විශේෂීකරණය කිරීම, නව දෙපාර්තමේන්තු හෝ ඒකක පිහිටුවීමට කටයුතු කිරීම කළ යුතුවේ. එසේ වුවද, මෙම වාර්තාවේ දිනය වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම සඳහා මූලික පියවර ගෙන තිබුණි. නව උපාධි වැඩසටහන් හතරක් හඳුන්වාදීමට කටයුතු කරමින් පවතී. භාෂා ඉගෙනුම් දෙපාර්තමේන්තුව යටතේ උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා වන යෝජනාව ඉදිරිපත් කර ඇති අතර, එය නිර්දේශ කිරීම සඳහා එළඹෙන ඉදිරි අධ්‍යයන කමිටු රැස්වීමට යොමු කරනු ලැබේ. | උපාධි වැඩසටහන් හඳුන්වාදීමට සහ විශේෂීකරණය, නව දෙපාර්තමේන්තු හෝ ඒකක ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 නොවැම්බර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛ අංක. 15/2015ට අනුව අභ්‍යන්තර සිසුන් සඳහා පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල මාස 03ක් ඇතුළත නිකුත් කළ යුතුය. කෙසේවෙතත්, අධ්‍යයන වර්ෂ 2017/2018 සඳහා පවත්වන ලද අවසාන විභාගවල ප්‍රතිඵල මාස 04 සිට 06 දක්වා පරාසයක ප්‍රමාදයක් සහිතව නිකුත් කර ඇත. මෙය ශිෂ්‍යන්ගේ රැකියා අවස්ථාවන්ට බලපෑම් කරනු ඇත. | බොහෝ පිළිතුරුපත්‍රවල දෙවන ඇගයීම බාහිර පරීක්ෂකයන් විසින් සිදුකරනු ලැබේ. දෙවන ඇගයීමෙන් පසු අනපේක්ෂිත අයුරින් නියමිත කාලයට අදාළ ප්‍රතිඵල ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වේ. නියමිත කාලය තුළ ප්‍රතිඵල ඇගයීම සහ නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් අනුගමනය කිරීමට කටයුතු කෙරේ. | චක්‍රලේඛය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව අධ්‍යක්ෂ තනතුරද ඇතුළත්ව තනතුරු 11ක් වූ අතර, අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 36ක් විය. මෙම වාර්තාගත දිනය වනවිටත් එම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | කොමිෂන් සභා චක්‍රලේඛ අංක. 876 අනුව, රේඛීය අමාත්‍යාංශයෙන් ලබාගත් නාම ලේඛනය අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු බොහෝ සංඛ්‍යාවක් පුරවා ඇත. 2019 වර්ෂයේදී අමාත්‍යාංශය වමහින් යොමු කරන ලද නම් ලැයිස්තුව අනුව බඳවා ගැනීම් සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. | අනුමත ස්ථිර නිලධාරී සංඛ්‍යාව මත පදනම්ව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4. වගවීම සහ යහපාලනය**

------------------------

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 හා 2019 වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සම්බන්ධ වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බැවින් ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අරමුණු ළඟාකරගෙන ඇත්දැයි නිශ්චය කළ නොහැක. එම නිසා, ආයතනයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී | 2018 හා 2019 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීමට සැලකිය යුතු කාලයක් ප්‍රමාද විය. 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඇගයීම හා ප්‍රමාණනය කිරීම සඳහා නිශ්චිත කාලරාමුව තුළ ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සැලැස්ම උපයෝගී කරගැනීම සම්බන්ධයෙන් ඇගයීම හා ප්‍රමාණනය කිරීමට විගණනයේදී හැකියාවක් නොලැබුණි. | | |

**4.2** **තිරසර සංවර්ධන අරමුණු**

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ 2017 අගෝස්තු 14 දිනැති ලිපි අංක NP/SP/SDG/17 හා තිරසර සංවර්ධනය සඳහා වූ “2030 න්‍යාය පත්‍රය” අනුව, එම විෂය පථයට අයත් කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිළිබඳව විශ්වවිද්‍යාලය දැනුවත් කර ඇත. කෙසේවෙතත්, චක්‍රලේඛයට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ආයතනය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ඒ අනුව, තිරසර සංවර්ධනය සඳහා වහාම අවශ්‍ය පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |